**කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**------------------------------**

**2018** වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන **2019** මාර්තු 08 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර**,** එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව **2019** මැයි **30** දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජූලි 26 දිනද, සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කරුවලගස්වැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-------------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| i. | සමාලෝචිත වර්ෂයේ සිදුකළ පෙර පාසැල් සංවර්ධන කටයුතු වෙනුවෙන් වයඹ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු රු.120,000 ක මුදල හා සංවර්ධන කටයුතු වෙනුවෙන් ගිවිසුම්ගත ආයතන වෙත ගෙවිය යුතු රු.120,000 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් වර්ෂයට අදාල ගණුදෙනු නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| ii. | එගොඩපිටිය වැසිකිළි ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ට ගෙවිය යුතු රු.370,000 ක්, කුට්ටිගල් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු රු.120,000 ක් සහ වීදි පහන් උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු රු.33,800 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| iii. | කසළ මධ්‍යස්ථානය සඳහා ගබඩාවක් ඉදිකිරීමට සමාලෝචිත වර්ෂයේ දැරූ වියදම ප්‍රාග්ධනිත කිරීමේදී අත රැඳවුම් මුදල රු.79,912ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

**(ආ) ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

**(i) ලැබියයුතු ගිණුම්** -----

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් 05 ක ශේෂ වල එකතුව රු.3,002,574 ක් වූ අතර එයින් වර්ෂ 03ක කාලය ඉක්මවූ ශේෂ වල එකතුව රු.676,178 ක් විය. | ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට පියවර ගත යුතු වේ. | හිඟ වරිපනම් බදු, කුලී, ජල බදු හා විවිධ ණයගැතියන්ගේ හිඟ මුදල් කොටසක් අයකර ඇති අතර ඉතිරි හිඟ මුදල් හා කර්මාන්ත ණයගැතියෝ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

**(ii) ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් 04 ක ශේෂවල එකතුව රු.3,669,595 ක් වූ අතර එයින් වර්ෂ 03 ඉක්මවූ ණයහිමියෝ රු.1,213,317 ක් විය. | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | විවිධ ණයහිමි, කර්මාන්ත ණයහිමි, ආදායම් වෙනුවෙන් තැන්පතු හා විවිධ තැන්පතු කොටසක් ගෙවා ඇති බැවින් ඉතිරිය නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතු වටිනාකම රු.5,036,950 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>571 වගන්තිය | වසර 02 ක් ඉක්මවූ තැන්පතු 19 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මුදල් රෙගුලාසි වලට අනුව වසර දෙකක් ඉක්මවූ ඇප තැන්පතු ඉදිරියේදී නිදහස් කිරීමට කටයුතු කරමි. |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,024,927 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.2,366,445 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | 2018 | | | | 2017 | | | |
| | රු. '000 | රු. '000 | රු '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 5,715 | 4,400 | 4,895 | 1,461 | 5,347 | 3,866 | 4,393 | 1,490 |
| කුලී | 2,601 | 2,346 | 6,914 | 573 | 1,807 | 1,483 | 1,571 | 213 |
| බලපත්‍ර ගාස්තු | 242 | - | 84 | - | 468 | 149 | 149 | - |
| වෙනත් ආදායම් | 36,238 | - | 27,424 | - | 35,804 | - | 22,052 | 421 |
| එකතුව | 44,796 | 6,746 | 39,317 | 2,034 | 43,426 | 5,498 | 28,165 | 2,124 |

❖ රැස් කළ ආදායම තුල සමාලෝචිත වර්ෂයට බිල් කළ ආදායමෙන් කළ එකතු කිරීම් සහ පසුගිය වර්ෂවල හිඟ ආදායමෙන් කළ එකතු කිරීම් ඇතුළත්ව තිබේ .

## 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට මුළු බිල්කිරීම් රු.6,746,372 ක් හා සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති හිඟය රු.2,124,027 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය තුලදී බිල්කළ ආදායමෙන් රු.5,801,994 ක් හා හිඟ ආදායමෙන් රු.1,536,018 ක් රැස්කර තිබුණි. ඒ අනුව වර්ෂය තුල සමස්ත ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 83 ක් පමණ විය. | වාර්ෂික බිල් කිරීම් වර්ෂය තුළදී අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

## 2.2.3 වරිපනම් හා බදු

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයේ හිඟ හිටි වරිපනම් රු.362,902 න් වර්ෂය තුලදී රු.106,100 ක් රැස්කර තිබුණු අතර එය වර්ෂය ආරම්භයේ හිඟ හිටි මුදලින් සියයට 29 ක් විය. කරුවලගස්වැව ජල ව්‍යාපෘතියේ ජල සැපයුම විසන්ධි කරන ලද ජල පාරිභෝගිකයින් 35කගේ හිඟ ජල ගාස්තු රු.97,035 ක් සහ ඉපලෝගම ජල ව්‍යාපෘතියේ ජල පාරිභෝගිකයින් 71 දෙනෙකුගේ හිඟ සාමාජික ගාස්තු රු.346,300 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | 2018 දෙසැම්බර් 31 දිනට පැවති මුළු වරිපනම් හිඟයෙන් රු. 23,839 ක්, හිඟ ජල ගාස්තු රු.200,711 ක් සහ හිඟ ජල සාමාජික ගාස්තු රු.203,150 ක් අයකරගෙන ඇත. ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.4 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බිල්කළ කඩ කුලී රු.1,752,255 න් වර්ෂය තුලදී රු.1,287,477 ක් අයකර තිබුණු අතර එය බිල්කළ මුදලින් සියයට 73 ක ප්‍රමාණයකි. | හිඟ බිල්කල කඩ කුලී කඩිනමින් අය කිරීමට පියවර ගත යුතු වේ. | 2018 දෙසැම්බර් 31 දිනට පැවති කඩ කුලී ශේෂයෙන් රු.127,215 ක මුදලක් 2019 මාර්තු 31 වන විට අයවී ඇත. ඉතිරිය අයකිරීමට කටයුතු කරමි. |

### 2.2.5 උසාවි දඩ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.675,996 ක් විය. | අයවිය යුතු උසාවි දඩ කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ. රු.675,996 න් රු.376,998 ක් 2019 මැයි 03 දින ලැබී ඇත. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මං මාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 03 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | සියලුම ප්‍රධාන කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා කඩිනමින් පැනවීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී අවශ්‍ය සෑම කටයුත්තක් සඳහාම අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කරමි. |

**(ආ) ප්‍රතිපාදන නොසැලසීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු ඇස්තමේන්තු අගය රු.110,000 ක් වූ කාර්යයන් 03 ක් සඳහා වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සළසා නොතිබීම නිසා එම කාර්යයන් ඉටුකළ නොහැකි වී තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටුකළ යුතු කාර්යයන් සඳහා ප්‍රතිපාදන සලසාගෙන අදාල කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතු වේ. | 2018 ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු සේවයේ නියුතු සෞඛ්‍ය කම්කරුවන් සඳහා ආරක්ෂිත උපකරණ සැපයීම වෙනුවෙන් වෙන් වූ ප්‍රතිපාදන වැය දරා ඇති අතර ක්‍රීඩා භූමි, ක්‍රීඩා උපකරණ සඳහා හා පොදු ක්‍රීඩා කටයුතු සඳහා ප්‍රතිපාදන අත්‍යවශ්‍ය නොවීය. |

**(ඇ) ඉටු නොකළ කාර්යයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ වාර්ෂික අයවැය මගින් රු.42,780,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු කර්තව්‍යයන් 16ක් වර්ෂය තුල ඉටුක නොතිබුණි. | වාර්ෂික අයවැය ලේඛනය සකස් කිරීමේදී සත්‍ය වශයෙන් දැරිය යුතු හා අවශ්‍යතාවයන් හඳුනාගෙන අයවැය ලේඛනය සකස් කළයුතු වේ. | අයවැය යෝජනා අතරින් සභා අරමුදල් ව්‍යාපෘති සියල්ල නිම කිරීමට තරම් ප්‍රමාණවත් ආදායමක් සභාවට නොමැතිවීමත් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ආධාර හා පළාත් නිශ්චිත ප්‍රදාන අපේක්ෂිත පරිදි නොලැබීමත් හේතුවෙන් අයවැය මගින් ප්‍රතිපාදිත සියළු කාර්යයන් ඉටුකළ නොහැකි විය. |

**(ඈ) අත්හැර දැමූ කාර්යයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රඹාවැව ජල ව්‍යාපෘතිය දීර්ඝ කිරීම වෙනුවෙන් 2016 හා 2017 වර්ෂවලදී රු.1,149,000 ක් වැයකර තිබුණු නමුත් 2018 අප්‍රේල් 29 දින වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල | ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කළ යුතු වේ. | ව්‍යාපෘතියේ ඉතිරි අදියර අවසන් කිරීමට කිසිදු ප්‍රතිපාදන මුදලක් පළාත් පාලන අමාත්‍යාංශයේ හෝ පළාත් සභාව මගින් වෙන්කර නොදීම නිසා මේ වනවිට ජලය බෙදාහැරීමට නොහැකි වී ඇත. |

ලබානොගෙන අත්හැර දමා තිබුණි.

**(ඉ) සන අපද්‍රව්‍ය කළමනාකරණය** -

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 වර්ෂයේ රු.1,338,227 ක් හා 2018 වර්ෂයේ රු.719,200 ක් වැයකර කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණද නගරයේ කසළ එක්රැස් කර බැහැර කිරීම හැර අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ ක්‍රියාවලියක් ආරම්භ කර නොතිබුණි. | කසළ ප්‍රතිචක්‍රිකරණ හා බැහැර කිරීමේ විධිමත් ක්‍රියාවලියක් ආරම්භ කිරිමට කටයුතු කළ යුතු වේ. | කොම්පෝස්ට් නිෂ්පාදනයට අවශ්‍ය දිරන කසළ එකතු නොවන බැවින් සහ ඒ සඳහා අවශ්‍ය උපකරණ නොමැති බැවින් කොම්පෝස්ට් පොහොර නිපදවීම සිදු කරනු නොලබයි. |

**(ඊ) තිරසර සංවර්ධන ඉලක්ක** ---

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" ප්‍රකාරව සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක 12ක් හඳුනාගෙන එම අරමුණු හා ඉලක්ක ළඟා කරගැනීමේ ක්‍රියාකාරකම් රාශියක් 2018 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුල සතිපොළ පැවැත්වීම තුලින් බල ප්‍රදේශයේ නිෂ්පාදන අලෙවි කිරීමට අවස්ථාව ලබාදීම සහ අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කිරීම හා ස්වභාවික ආපදා සඳහා සහන සැලසීම යන ඉලක්ක යටතේ ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර තිබුණු ක්‍රියාකාරකම් වර්ෂය තුල ආරම්භ කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සතිපොළ පිහිටි ස්ථානය ජනාකීර්ණ පරිසරයක් තුළ පිහිටා නොමැති වීමත් මාර්ග පද්ධතිය ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් දුර්වල මට්ටමක පැවතීමත් නිසා පාරිභෝගික පැමිණීම සිදුනොවේ. එබැවින් මෙම සතිපොළ අක්‍රීය තත්ත්වයේ පවතී.<br>කසළ කළමනාකරණය විධිමත් කිරීම සඳහා පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන්, අවිධිමත්ව අපද්‍රව්‍ය බැහැර කිරීම අවම කිරීම සඳහා දැනුවත් කිරීමේ පුවරු සවිකර ඇති අතර රු.799,122 ක් වැය කර සාලියවැව කසළ මධ්‍යස්ථානයේ ගබඩාවක් ඉදිකර ඇත. ස්වභාවික ආපදා සඳහා සහන සැලසීම යටතේ 2018 වර්ෂයේ පැවති තද නියඟයට මුහුණදීමට රු.918,966 ක වියදමක් දරා ළිඳක් ඉදිකර මහජනයාට පරිහරණයට ලබාදුනි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා** -

**----------------------------------**

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | වර්ෂයට අදාළව කරුවලගස්වැව මහජන පුස්තකාලයේ සිදුකර තිබුණු පුස්තකාල සමීක්ෂණයේදී රු.50,264 ක් වටිනා පුස්තකාල පොත් 282ක ඌනතාවය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | පුස්තකාල පොත් ඌනතාවයන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුවේ. | මෙම පොත් ප්‍රමාණයෙන් රු.24,024 ක් වටිනා පොත් 100 ක් නැවත හමු වී ඇත .ඒ අනුව සත්‍ය වශයෙන් අස්ථානගත වී ඇත්තේ රු.26,240 ක් වටිනා පොත් 182 ක් පමණි. එම මුදල අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | නීල බැම්ම ගිමන්හල දෙවන අදියර ඉදිකිරීම සඳහා වාස්තු විද්‍යාඥ සැළසුම්, ව්‍යුහ සැලසුම් හා ඇස්තමේන්තු සැකසීම වෙනුවෙන් 2015 හා 2017 වර්ෂවලදී උපදේශක ඉංජිනේරු දීමනා ලෙස රු.400,000ක මුදලක් දරා තිබුණු නමුත් අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්ත්වයට පත් කර සභාවට ආදායම් ඉපයීමේ කාර්යයකට යෙදවීමට කටයුතු කළ යුතු වේ. | නීලබැම්ම ගිමන්හල ඉදිකර නඩත්තු කරගෙන යාම සඳහා පෞද්ගලික අංශයේ සහයෝගය ලබාගැනීමට කටයුතු යොදා ඇති අතර ඉදිරියේදී අදාල ස්ථානය ටෙන්ඩර්කර ගැනුම්කරුවකු තෝරා වාර්ෂික බදු පදනම මත ලබාදීමට අදහස්කර ඇත. |
| (ඇ) | පසුගාමී හා හුදකලා ගම්මාන ව්‍යාපෘතිය 2017 යටතේ ඔල්ලුක්කුලිය ළිඳ ඉදිකිරීම, ළිඳ වටා වැට ගැසීම හා පිවිසුම් මාර්ගය සකස් කිරීම සඳහා රු.1,089,055 ක් වැයකර තිබුණු අතර පෞද්ගලික ඉඩමක සිදුකර තිබුණු මෙම ඉදිකිරීම් සහිත භූමිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | අදාල භූමිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පසුගාමී හුදකලා ගම්මාන ව්‍යාපෘතිය 2017 යටතේ ඔල්ලුකුලිය ළිඳ ඉදිකර ඇති ඉඩම නිත්‍යානුකූලව පවරා ගැනීමට මිනුම් නියෝග ඉල්ලා කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් වෙත භාර දී ඇත . |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ද්වීතියක ශ්‍රේණියට අයත් පුස්තකාලාධිපති තනතුරු 03ක්, සංවර්ධන නිලධාරි තනතුරු 01ක්, තාක්ෂණ නිලධාරි තනතුරු 01 ක්, පෙර පාසල් ගුරු තනතුරු 01 ක්, වැඩ | කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ද්විතීයික ශ්‍රේණියට අයත් තනතුරු අතරින් ලේකම් තනතුර හා ආදායම් පරීක්ෂක තනතුරු වල පුරප්පාඩු මේ වනවිට සම්පූර්ණ වී ඇත .ඉතිරි |

| | |
|---|---|
| පරීක්ෂක තනතුරක්, ආදායම් පරීක්ෂක තනතුරු 01 ක් හා ප්‍රාථමික ශ්‍රේණියට අයත් රියදුරු තනතුරු 01 ක්, කාර්යාල මාර්ග කම්කරු තනතුරු 03ක් හා පුස්තකාල සහායක තනතුරු 03 ක් පුරප්පාඩුව පවතී. | තනතුරු නැවත වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවාගැනීම සිදුකරනු ලැබේ. |

**3.4 වත්කම් කළමනාකරණය** **-**

**3.4.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්** **--------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.18,000,000ක් වැයකර 2014 වර්ෂයේ ඉදිකර තිබුණු නීල බැම්ම නිවාඩු නිකේතනය හා සති පොළවල් 02 ක් නිශ්ක්‍රීයව පැවතුණි. | සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමේ ක්‍රමවේද සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වේ. | නීලබැම්ම නිවාඩු නිකේතනය ඉදිකර නඩත්තු කරගෙන යාම සඳහා පෞද්ගලික අංශයේ සහයෝගය ලබාගැනීමට කටයුතු යොදාඇති අතර ඉදිරියේදී අදාළ ස්ථානය ටෙන්ඩර් කර ගැනුම්කරුවකු තෝරා වාර්ෂික බදු පදනම මත ලබාදීමට අදහස්කර ඇත. සතිපොළ පිහිටි ස්ථානය ජනාකීර්ණ පරිසරයක් තුළ පිහිටා නොමැතිවීමත් මාර්ග පද්ධතිය ඇතුලු අනෙකුත් යටිතල පහසුකම් දූර්වල මට්ටමක පවතින නිසා පාරිභෝගික පැමිණීම සිදු නොවේ. එබැවින් එම සතිපොළ අක්‍රීය තත්ත්වයේ පවතී. |

**3.4.2 පවරා නොගත් වත්කම්** **--**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු ගොඩනැගිලි පිහිටි ඉඩම් 10 ක් හා සභාව විසින් පාලනය හා නඩත්තු කෙරෙන ක්‍රීඩාපිටි සහ සතිපොළ භූමිවල අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | පවරා නොගත් ඉඩම් හා ගොඩනැගිලි පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාව සතු ඉඩම් අතරින් මේ වනවිට ඉඩම් 03 ක් මිනුම්කර අවසන්ව ඇති අතර, ඉතිරි ඉඩම් සඳහාද මිනුම් කර පවරා ගැනීමට කටයුතු කරමි |

**3.5 ප්‍රසම්පාදනය**

**---------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| පෙර වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂය සඳහාද ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරිමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

**4 . ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය** **--**

**-------------------------------------**

**4.1 අභ්‍යන්තර විගණනය**

**----------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර තිබුණද කොන්ත්‍රාත්, බැංකු සැසඳුම්, සේවක ණය, ස්ථාවර වත්කම්, අතැති තොග හා වාහන පරිපාලනය සම්බන්ධයෙන් විගණන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. | විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණනය සිදු කිරීමට පියවර ගත යුතු වේ. | 2019 වර්ෂයේ විගණනය සිදුකිරීමේදී විගණනයෙන් පෙන්වා දී ඇති විෂයය ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානයක් යොමුකරමින් අභ්‍යන්තර විගණනය සිදුකිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |